


මෙතුනි සයාරා රත්නායක

8 ශ්‍රේණිය E

# වැම්පයර් මිතුරන්

**කතෘ**

ආර්.එම්.එම්.සයාරා රත්නායක

**කතෘගේ වෙනත් කෘති**

රොබෝගේ ඇබැද්දිය

තුන්ඉරි අප්පු

මහාමායා බාලිකා විදුහල

8 ශ්‍රේණිය E

2026.05.10

ISBN : 978 – 624 -211-041-7

# පිදුම

කුඩා කල සිට මා
දැනුමෙන්
පෝෂණය කල
ගුරුභවතුන්ට හා
මෙම පොත ලිවීමට
මට සහය දුන් මාගේ
දෙමාපියන්ට මම
මෙම පොත පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කල හැකිය.දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කරතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි මෙවර ද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුනතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස සියවි ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතයක් කන්ද උඩරටට අගයක් එකතුකළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. ඒ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10



සීත සුළං කාරයේ ජනෙල් පියන්වලට ඉහළින් හමා ආවේ ය. කාරය පිටුපස අසුනේ නිදා සිටි නොක්ස් පිබිදුණේ එම සීතල සුළඟට ය.වටපිට බැලූ ඔහුට වැටහුණේ ඔහු තම නිවස ආසන්නයට පැමිණ ඇති බවයි.ඒ සමඟ ම ඔහු තම ඔරලෝසුව දෙස බැලුවේ ය.වේලාව මධ්‍යම රාත්‍රිය ද පසු කොට අවසන් ය.ඔහු හරි බරි  ගැසී ආසනයේ වාඩි වුණේ ය.කාරය තවත් ඉදිරියට ඇදෙද්දී ඔහු , කාරය පදවන තම යහළුවාට කතා කළේ ය.

"ඩ්‍රැවෙනො මාව අපේ ගෙදර ළඟින් බස්සන්න."එසේ කියා ඔහු තව ටික දුරක් ගොස් තෙමහල් නිවසක් ඉදිරියේ කාරය නැවැත්වූයේ ය.

"ස්තුතියි ඩ්‍රැවෙනො .පරිස්සමින් යන්න.තොදිනෝ "කියා නොක්ස් කාරයෙන් බැස ගියේ ය.

එයින් පුදුමයට පත් වූයේ ඩ්‍රැවෙනො ය. ඒ ඔහු සුභ රාත්‍රියක් පැතීමට යොදා ගත් වචනයට ය. ‘තොදිනෝ’ කියන්නේ වැම්පයර් භාෂාවෙන් ‘සුභ රාත්‍රියක්’යන්න යි.මෙයින් විස්මයටත් කුතුහලයටත් පත් වූ ඩ්‍රැවෙනොගේ සිතට නොයෙක් ආකාරයේ සිතිවිලි වද දුන්නේ ය.ඔහුට සිතුණේ නොක්ස් වැම්පයර් කෙනෙක් ද? එසේත් නැතිනම් ඔහු එම වචනය පමණක් දැන කතා කළා ද? ඔහු මම වැම්පයර් කෙනෙක් බව දැනගෙන ද?නමුත් වැම්පයර් භාෂාව දන්නේ වැම්පයර්වරු පමණි. එසේ නම් ඔහු මෙම වචනය දැන ගත්තේ කෙසේ ද?මෙලෙස ඩ්‍රැවෙනොගේ සිතට සිතිවිලි වරින් වර වද දුන්නේ ය.පසුව ඔහු සිතා ගත්තේ ඒ තමාට ඇසුණු විදිය කියා ය.

මේ අතර නොක්ස්ගේ සිතට ද සිතිවිලි වද දුන්නේ ය.ඒ තමා නිදිමතේ පැවසූ වචනයට ය.ඔහුට හැඟුණේ වරදකාරී හැඟීමකි.ඔහුට සිතුණේ ඩ්‍රැවෙනො ද වැම්පයර් කෙනෙක්ද? නොමැති නම් මා එය පවසද්දී ඔහු පුදුම වූයේ කුමකටද? මෙලෙස ඔහුටද සිතිවිලි වද දුන්නේය. අවසානයේ ඔහු සිතාගත්තේ මේ කිසි දෙයක් ඩ්‍රැවෙනොට හෙලි නොකරන බවයි.ඉන්පසු ඔහු තම අත තිබූ යතුරෙන් දොර හැර ගත්තේය.

නොක්ස් යනු ඩ්‍රැවෙනොගේ,සෞයිරන්ගේ,අයොරියන්ගේ සහ පර්කිවන්ගේ හොඳම මිතුරාය.මොහු මෙම යහළුවන් අතර තිබූ සාදයකට සහභාගී වී නිවසට පැමිණියේ ඩ්‍රැවෙනො සමඟය. ඒ අතරේදී මෙම සිදුවීම සිදුවී තිබුණි. මෙම යහළුවන් පස්දෙනාම වැම්පයර්වරුන්ය. නමුත් ඔවුන් එය රහසක් ලෙස තබාගනී.මෙම යහළුවන් සැමදෙනා සිතා සිටින්නේ තමා පමණක් වැම්පයර් කෙනෙක් වන බවයි.නොක්ස් යනු මේ යහළුවන් පස්දෙනා අතරින් ධනවත්ම කෙනාය. ඔහුගේ පවුලේ අයවත් ඔහු වැම්පයර් කෙනෙකු බව නොදනී.නමුත් දැන් ඩ්‍රැවෙනොගේ සිතෙහි සැකයක් උපදී. ඒ‘නොක්ස් වැම්පයර් කෙනෙක් ද?‘ කියා ය.

නිවසට ඇතුළු වූ පසු නොක්ස් ඉක්මනින් ම ගොස් ඇඟ පත සෝදා ඇඳට ගොස් නිදා ගත්තේ ය. නොක්ස් අවදි වන විට පසුදා උදෑසන 10 පමණ වී තිබුණි.එවිට ඔහුට මතකා වුණේ එදින තම නැඟණියගේ 18 වන උපන් දිනය වන බව යි. එනිසා විගසින් නැඟිට ගත් ඔහු දත් මැද මුහුණ සෝදා නංගීගේ කාමරය දෙසට ගියේ ය.එම අතරමඟ ඔහුට ඔහුගේ ආදරණීය වවුලෙකු වන ඇටිකස් මුණ ගැසුණේ ය.එහෙයින් ඔහු බියට පත් විය.ඒ ඔහු වවුලන් ඇති කළේ රහසිගතව ය. එනිසා වහා ම ක්‍රියාත්මක වූ ඔහු ඇටිකස් ව තම රහසිගත කාමරය වෙත ගෙන ගියේ ය.

මෙනිසා නොක්ස් තම නංගීගේ කාමරයට යන විට ප්‍රමාද වී තිබුණි. පසුව ඔහු නංගීගේ කාමරයේ දොරට තට්ටු කළේ ය. ඔහු අත තිබුණේ ඔහු තම නංගී වෙනුවෙන් ම මිල දී ගත් වටිනා අත් ඔරලෝසුවකි. එය වැම්පයර් ලොව සිටිනි ඉහළ පෙළේ වැම්පයර්වරු පළඳින එකකි. පසුව ඔඩෙසා වන නොක්ස්ගේ නංගී පැමිණ දොර හැරියා ය. ඇය නොක්ස් අත තිබූ වටිනා අත් ඔරලෝසුව දෙස බැල්මක් හෙළුවා ය.නොක්ස් ඇයට සුභ පතා එම වටිනා අත් ඔරලෝසුව ඇයට තෑගි කළේ ය.එම අත් ඔරලෝසුවේ පටිය රත්තරන් පාටින් ඔප දමා තිබුණි.එහි ඇතුළත තද කළු පැහැ ගත් අතර එහි ඉලක්කම් ද රත්‍රන් පැහැ ගත්තේ ය.එය අතට ගත් පසුව ඔඩෙසාගේ මුහුණේ අලංකාර සිනා රැල්ලක් ඇඳී ගියේ ය.

"මේක මට ද?"ඔඩෙසා ඇසුවේ ය.

"ඔව්,ඔයාට තමයි.ඔයා ඒකට කැමතියි ද?"

"ඔව්.මම ඒකට ගොඩක් කැමතියි"ඔඩෙසා සිනා මුසු මුහුණෙන් පැවසුවා ය.

ඉන් පසුව නොක්ස් ඔඩෙසාගේ කාමරයෙන් නික්මුණේ ය.

ඔඩෙසාගේ මිතුරිය වන සෙලොරියා ද ඔඩෙසාට උපන් දින තෑග්ගක් ලෙස ඇයට දී තිබුණේ එම වටිනා අත් ඔරලෝසුවයි.එය දැකීමෙන් ඔඩෙසා පුදුමයෙනුත් අති පුදුමයට පත් වුණා ය.ඇය සෙලොරියාගෙන් ඇසුවේ ඇය එය මිල දී ගත්තේ කොතැනින් ද කියා ය.එවිට සෙලොරියා ඔඩෙසාට පවසා තිබුණේ එය තම අයියා වන ඩ්‍රැවෙනො ගෙන දුන් බවයි.

සෙලොරියා යනු ඩ්‍රැවෙනොගේ නංගී ය.සෙලොරියා ඔඩෙසාට දීමට යමක් ඉල්ලූ විට ඩ්‍රැවෙනො මෙම අත් ඔරලෝසුව ගෙන විත් ලබා දී ඇත.එය ඩ්‍රැවෙනො ද ලබා ගෙන තිබුණේ වැම්පයර් ලොවෙන් ය.එය මිලෙන් ඉතා ම වැඩි වටිනා අත් ඔරලෝසුවකි.එම අත් ඔරලෝසුව ම ඔඩෙසාට ලබා දී  තිබුණේතම අයියා වන නොක්ස් ය.මෙය ඔඩෙසාගේ මහත් පුදුමයට හේතුවක් විය.පසුව ඔඩෙසා සිතා ගත්තේ එය ඩ්‍රැවෙනො සහ නොක්ස් එක ම කඩයකින් මිලදී ගන්නට ඇතැයි කියා ය.නමුත් ඇයගේ යටි සිත කීවේ මේ පිළිබඳ ව තව දුරටත් සොයා බැලීම හොඳයි කියා ය.

ඉන් ටික දවසකට පසු නොක්ස්ගේ පැරණි දිනපොතක් නැතිවී තිබුණි.එම දිනපොත නොක්ස්ගේ ප්‍රියතම දින පොත විය.එම දිනපොත නොක්ස් මුළු නිවසම හූරා සොයා බැලුව ද නොක්ස්ට එය සොයා ගැනීමට නොහැකි විය.


අවසානයේ ඔහු සොයා බැලුවේ තම නැණියගේ කාමරයේ ය.අවසානයේ ඔහුට එම දිනපොත ඔඩෙසාගේ පොත් රාක්කයේ තිබී සොයා ගැනීමට හැකි විය.නොක්ස් ඔඩෙසාගෙන් ඇසුවේ ඇය එම දිනපොත ගත්තේ ඇයි කියා ය.එවිට ඇය පැවසුවේ එහි පිට කවරය ඉතා අලංකාර නිසා එය ලබා ගත්තා කියා ය.

ඉන් පසු නොක්ස් ආපසු යාමට හැරෙන විට දුටුවේ ඔඩෙසාගේ කබඩය උඩ තිබෙන වැම්පයර් ලෝකයෙන් පමණක් ම සොයා ගැනීමට හැකි අත් ඔරලෝසු දෙක ය.ඉතා ම අලංකාර එම අත්ඔරලෝසු දෙක ඔඩෙසාට ලැබුණේ කොහෙන් ද?යන ප්‍රශ්නය නොක්ස්ගේ සිතට පළමුව ඇතුළු විය .පසුව නොක්ස් එය තම අතට රැගෙන පරීක්ෂා කර බැලී ය. එම පරීක්ෂාවෙන් ඔහුට වැටහුණේ එය වැම්පයර් ලොවෙන් ලබා ගත් බවයි .එහෙයින් ඔහු ඉමහත් කලබලයට පත් විය.ඒ ඔහුට පළමු ව වැටහුණේ තම  නංගී පසුපස තවත් වැම්පයර් වරයෙකු එන බවයි.ඒ වගේ ම සමහර විට කුමන හෝ අවස්ථාවක ඔහුට ලේ පිපාසය සෑදී ඔහු හෝ ඇය ඔඩෙසාගේ ගෙල සිදුරු කර ලේ බීමට අවස්ථාවක් ඇත.

“ඔඩෙසා, ඔයාට මේ අනිත් අත් ඔරලෝසුව ලැබුණේ කොහෙන් ද?”නොක්ස් ඇසුවේ කැළඹී ගිය සිතෙණි.

“එකක් දුන්නේ ඔයා අනික් එක දුන්නේ මගේ හොඳම යාළුවා ,සෙලිඹරා.” ඇය පිළිතුරු දුන්නා ය.

එයින් නොක්ස් තවත් කලබලයට පත් වූයේ මෙම අනික් අත් ඔරලෝසුව ඇයට ලබා දී ඇත්තේ ඇයගේ හොඳම යෙහෙළිය යි. ඔහුගේ මෙම කලබලකාරී ස්වාභාවය දුටු ඔඩෙසාගේ සිතෙහි සැකය ද තව තවත් තීව්‍ර විය.



“ඇයි ඔයා එකපාර ම කලබල වුණේ?” ඔඩෙසා එලෙස ඇසුවේ එනිසා ය.

“න........න......නෑ.......නෑ......මො...මො......මොකුත් නෑ.මම කලබල වුණේ නෑ...ඇයි මම කලබල වෙන්නේ”නොක්ස් එලෙස පැවසුවත් ඔහු සිටියේ බෙහෙවින් කලබල වීය.

ඉන්පසු ව නොක්ස් ඔඩෙසාගේ කාමරයෙන් පිට වී ආවේ ය.පසුව ඔහු තම කාමරයට ගොස් දීර්ඝ කල්පනාවක යෙදුණේ ය.අවසානයේ ඔහු තීරණය කළේ ඔඩෙසාගේ හොඳම මිතුරිය වන සෙලිඔරාගේ නිවසට ගොස් සොයා බැලීමට ය.

එදින ඔඩෙසා පාසල් ගිය පසු නොක්ස් තම කාරය ද රැගෙන ගියේ ය.ඒ පාසල අවසන් වෙන වේලාවට ය.පසුව ඔහු සෙලිඔරාගේ නිවස සොයා ගියේ ය.ඔහු එලෙස කිලෝමීටර් තුන හතරක් ගොස් රැවෙන්බොල්මෙ නිවස ඉදිරියේ නැවැත්වූයේ ය.පසුව ඔහු නැවතත් එම ස්ථානය නිවැරදිදැ යි බැලුවේ ය.එහෙත් ඔහු පැමිණ ඇත්තේ නිවැරදි ස්ථානයට ය.එය ඔහුට ඉර සඳ මෙන් විශ්වාසයේ තිබුණි.

ඉන්පසු ව ඔහු නැවතත් සොයා බැලුවේ එම නිවසේ සෙලොරියා නම් අයෙකු ජීවත් වනවාද යන්නයි. ඔහු එයද තහවුරු කර ගත්තේ ය.නමුත් ඔහු පැමිණ තිබුණේ ඔහුගේ මිතුරා වන **ඩ්‍රැවෙනොගේ** නිවසට ය!.

ඉන්පසු නොක්ස් ආපසු හැරී ගෙදර ආවේ ය.නමුත් නොක්ස්ගේ සිත කැළඹී තිබුණි. ඔහු නිවසට ඇතුළු වන විට ඔහුගේ මව කතා කළා ය.

"නොක්ස් ඔයා කොහේ ද ගියේ?.කෝ නංගී?"

"මොන නංගී ද?ඔඩෙසා ද?ඇයි එයා තාම ගෙදර ආවේ නැද්ද?"

"ඇ ළමයෝ!ඔයා ගියේ ඔඩෙසාව ගන්න නෙමෙයි ද ?"

"නෑ මම මේ ගියේ මගේ වැඩකට.එයාව ගේන්න නෙමෙයි."

"අයියෝ!මම හිතුවේ ඔයා ගියේ ඔඩෙසාව ගේන්න කියලා.ඒ නිසා මම ගියෙත් නෑ"

"ඈ................................!ඉන්න මම ඉක්මනට යන්නම්"

ඉන්පසු ඇසිපිය හෙලන එක් ක්ෂණයකින් නොක්ස් සිටියේ ඔඩෙසාගේ පාසලේ දොරටුව ඉදිරියේ ය.එවිට ඔඩෙසා කවුරුන් හෝ තමාව ගෙන යෑමට එන තුරු රැඳී සිටියා ය.පසුව නොක්ස් ඔඩෙසා ද රැගෙන නිවසට ගියේ ය.ඔවුන් නිවසට යන අතරමඟ කිසිදු කතාබහක් නොවීය.

නිවසට ගිය විගස ඔඩෙසා ඇඟ පත සෝදා ඇඳට ගියා ය.නමුත් නොක්ස් ගියේ වැම්පයර් ලොවට ය.ඒ තවත් අත් ඔරලෝසුවක් මිලදී ගැනීමට ය.ඒ එදින ඔහුට සාදයකට ඇරයුම් ලැබී තිබූ නිසාවෙනි.ඒ ඔහුගේ තවත් යහළුවෙකු වන සෞයිරන්ගේ නැගණියගේ උපන් දින සාදයට ය.එයට නොක්ස්ගේ නංගී වන ඔඩෙසාට ද ඇරයුම් ලැබී තිබුණි.ඉතින් ඔහු සෞයිරන්ගේ නැගණියට ද තෑග්ගක් ලෙස ලබා දීමට ගත්තේ ඔඩෙසාට දුන් ආකාරයේ අත් ඔරලෝසුවකි.

නොක්ස් එය ද රැගෙන සාදයට ගියේ ය.ඔහු එය තබා තිබුණේ විනිවිද පෙනෙන වීදුරු පෙට්ටියක ය.එහි දවටනය ඉවත් කළ වහා ම එම වීදුරු පෙට්ටිය තුළින් අත් ඔරලෝසුව පෙනුණේ ය.ඔහු සාදයට ගිය පසු සෞයිරන්ගේ නැගණිය වන ඉසබියෝට ඔහුගේ තෑග්ග ලබා දුන්නේ ය.

එතැනින් නොක්ස් නික්මුණු පසු ඉසබියෝ එම දවටනය ඉවත් කළා ය.එවිටම එතනින් සෙෆයිරන් ගියේ ය.ඔහු එය දැක බියටත් පුදුමයටත් පත් විය.ඒ වැම්පයර් වරයෙකු සාදයට පැමිණ ඇති නිසා ය.එදින පුර සඳ පායන දිනයක් විය.එදිනට වැම්පයර් ලොවෙන් වැම්පයර්වරු පැමිණ සමහරක් වැම්පයර්වරුන්ට විවිධ බල ලබා දෙයි.එසේත් නැතිනම් සඳකිරණ වැදී බල ලැබීමට ඉඩකඩ තිබේ.එවැනි සමහරක් අවස්ථාවලදී ගැටුම් ද ඇති වෙයි.

නමුත් , සෙෆයිරන් ඇඳ සිටියේ සඳ කිරණ වැදීමට නොහැකි ඇඳුම් කට්ටලයකි.ඔහු එසේ කළේ ඔහුට අවශ්‍ය වී තිබුණේ කිසිදු කලබලයක් නොකර දිගටම පවත්වාගෙන යන සාදයක් නිසාවෙනි.නමුත් වෙනත් වැම්පයර් කෙනෙකු පැමිණ මෙම සාදය විනාශ කළහොත් ඔහුගේ සැලසුම් සියල්ල විනාශ වෙනු නිසැක ය.

එනිසා ඔහු ඉසබියෝගෙන් ඇසුවේ මෙම අත් ඔරලෝසුව දුන්නේ කවුරුන් ද කියා ය.

"මේක දුන්නේ අර ඔයාගේ යාළුවා,අර ඔඩෙසාගේ අයියා , නොක්ස් " ඉසබියෝ පිළිතුරු දුන්නා ය.

නොක්ස් වැම්පයර් කෙනෙකු යැයි එවිට සෙෆයිරන් සිතා ගත්තේ ය. එහෙයින් සෙෆයිරන් නොක්ස් ව සොයා ගියේ ය.ඒ ඔහුගේ ගෙල පරීක්ෂා කිරීමට ය. නමුත් එදින නොක්ස් හැඳ සිටියේ ගෙල ආවරණය වන පරිද්දෙනි.එහෙයින් සෙෆයිරන් එම වැඩය අතහැර දැමුවේ ය.

ඉන් ටික වේලාවකට පසු වැම්පයර්වරු කඩා වැදුණේ ය. එයින් ඉමහත් කලබලයට පත් වූයේ සෙෆයිරන් ය.සාදයට පැමිණ සිටි සැවොම හිස ලූ ලූ අත දිව ගියහ.සෙෆයිරන්ට අවශ්‍ය වූයේ සාමකාමී සාදයකි. නමුත් දැන් , සියළු දෙනා කලබලයට පත් වී අවසන් ය.




ඉන් ඔහු ඉටා ගත්තේ මෙම වැම්පයර්වරු සියළු දෙනා පරාජය කර ආපසු හරවා දමා යැවීමට ය. එහෙයින් සෞයිරන් වැම්පයර්වරු සිටින සටන් බිමට ගියේ ය.ඔහු තමාට තිබෙන සෑම බලයක් ම යොදා සටන් කළේ ය.

නමුත්, ඔහු ටිකෙන් ටික දුර්වල වීමට පටන් ගත්තේ ය.මෙදෙස බලා සිටීමට නොහැකි වූ සෞයිරන්ගේ යහළුවන් වන නොක්ස්,ඩ්‍රැවෙනො,අයොරියන් හා පර්කිවන් ද සටන් බිමට ගියහ.

ඉන්පසු මොවුන් පස්දෙනාගේ ම තිබෙන විවිධාකාර වූ වැම්පයර් බල යොදාගෙන සටන් කළහ. නමුත්, අනෙක් වැම්පයර්වරු තවමත් බලවත් වූහ.මොවුන් පස්දෙනා අනෙක් අය වැම්පයර්වරු බව පළමු වතාවට දැන ගත්තේ එදින ය.මොවුන් සැමදෙනාගෙන් ම සඟවා තිබූ සත්‍ය එදින මොවුන් පස්දෙනා දැනගත් හ. නමුත් සාදයට පැමිණි මිනිසුන්ට මෙහි වන කිසිදෙයක් තේරුම් ගැනීමට අපහසු විය.ඔවුන් පුදුමයෙන් බලා සිටියහ.අවසානයේ ඔවුන්ට සිදු වූයේ ඔවුන් පස්දෙනාගේ ම බල තාවකාලික ව එක් අයෙකුට ලබා දීමට ය.

එහෙයින් සෞයිරන්ව මැද තබා අනික් සතර දෙනා වටේට හිටියේ ය.ඉන්පසු නොක්ස් මැතිරීමට පටන් ගත්තේ ය.එවිට ද ප්‍රතිවාදීන්ගෙන් ප්‍රහාර එල්ල විය.අවසානයේ සෞයිරන් වඩාත් බලවත් වූයේ ය.ඉන්පසු ඔහු වැම්පයර්වරු සමඟ සටන් වැදී ලෙහෙසියෙන් ම දිනුම ලබා ගත්තේ ය.වැම්පයර් ලොවෙන් පැමිණි වැම්පයර්වරු දුර්වල වී පලා ගියහ.ස්වල්ප වේලාවකින් නැවත සාදය ද ඇරඹුණේ ය.



ඉසබියෝගේ උපන්දින සාදය අවසන් වී නොක්ස් නිවසට පැමිණෙන විට මධ්‍යම රාත්‍රිය ද පසු වී තිබුණි.නොක්ස්ආ විගස ම දත් මැද ඇඟ පත සෝදා නින්දට ගියේ ය.ඊළඟ උදයේ අවදි වූ විගස ඔහු තම යහළුවන්ට කතා කළේ ය.ඊට පසු ඩ්‍රැවෙනොගේ නිවසට ගියේ ය.ඔහු ඩ්‍රැවෙනොගෙන් ඇසුවේ ඔහු වැම්පයර්වරයෙකු බව නොක්ස්ට සැඟවූයේ ඇයි දැයි කියා ය.නමුත් නොක්ස්ට දීමට පිළිතුරක් ඩ්‍රැවෙනොට තිබුණේ නැත.

“ඔයා ....වැම්පයර් කෙනෙක් වුණේ කොහොමද?”ඩ්‍රැවෙනො ඇසී ය.

“ඒක දිග.......... කතාවක් ”කියා නොක්ස් සුසුමක් හෙළුවේ ය.

“මගේ නංගී, ඔඩෙසා ගිය ආත්මයේත් මගේ ම නංගී . ඒ වගේ ම වැම්පයර් කෙනෙක්. එයා ගිය ආත්මයේ එයාගේ ඉස්කෝලේ ළමයෙක් එයාගේ බෙල්ල හපලා. ඒ ළමයාත් වැම්පයර් කෙනෙක්. ඉතින් මගේ නංගී කලන්තේ දාලා වැටිලා. ආයෙත් නැගිටිනකොට ඔඩෙසා ඉදලා තියෙන්නේ වැම්පයර් ලෝකේ. කොහොම හරි ඔඩෙසා එතනින් ඇවිල්ලා. ඒ වගේ ම එයාව වැම්පයර් කෙනෙක් කරපු ළමයා වැම්පයර් ආත්මෙන් නිදහස් වෙලා.ඒ වුණත් මගේ නංගී වැම්පයර් කෙනෙක් වෙලා. නංගී ඔහොම ටික කාලයක් ඉදලා එයාට එපා වෙලා.ඉතින් එයා වැම්පයර් ලොව රජතුමාට දන්වලා එයාට ආයෙත් මනුස්සයෙක් වෙන්න ඕනෙ කියලා. ඉතින් එතුමා කියලා එහෙනම් තවත් මිනිසෙක්ව වැම්පයර්වරයෙකු කරන්න කියලා. ඒත් මගේ නංගීට උවමනා වුණේ නෑ අනිත් මිනිස්සුන්ගේ ලේ බොන්න. ඒත් මට ඉවසන්න බැරි වුණා මගේ ම නංගීට කන්න බොන්න බැරුව ඉන්නවා දකින්න. ඩ්‍රැවෙනො, ඔයා දන්නවානේ වැම්පයර්ලට මිනිස්සු කන බොන මොනවත් කන්න බෑ කියලා. වැම්පයර්ලට උරුම එකම දේ මිනිස්සුන්ගේ ලේයි, අපේ වවුල්ලු ගෙනත් දෙන මීයොය් විතරයි කියලත්. ඉතින් මගේ නංගී ඒ කෑම අප්‍රිය කළා. එයාට කන්න ඕන වුණේ සාමාන්‍ය මිනිස්සු කන කෑම.ඒත් ඉතින් එයා ඒවා කන්න ගියා ම එයාට වමනය ගියා.ඉතින් මම නංගීට කිවුවා එයාට මනුස්සයෙක් වෙලා මාව වැම්පයර් කෙනෙක් කරන්න කියලා.”

කතාව අතරමඟ නැවැත් වූ නොක්ස් දෙනෙතින් කඩා හැලුණු කඳුලු පිස දැමුවේ ය. ඔහු නැවත කතාව ආරම්භ කිරීමට සැරසෙන විට ඩ්‍රැවෙනොගේ කාමරයේ දොරට කවුදෝ තට්ටු කළේ ය.එනිසා නොක්ස් තම කඳුලු ඉක්මනින් පිස දැමුවේ ය.එවිට නැවතත් තට්ටු කළේ ය.එවිට ඩ්‍රැවෙනො “ඇතුළට එන්න ”යැයි පැවසුවේ ය.

“ආ...... මේ අම්මානේ”ඩ්‍රැවෙනො පැවසුවේ ය.

ඩ්‍රැවෙනොගේ අම්මා වන ආර්ඩෙලෙනා මහත්මිය අත දුම දාන තේ කෝප්ප දෙකක් ද තිබුණි.

“ඒක නෙමෙයි අම්මා කොහොමද දන්නේ නොක්ස් මාව හම්බ වෙන්න ආවා කියලා”ඩ්‍රැවෙනො ඇසී ය.

“මම දැක්කා කාගේ හරි සපත්තු දෙකක් එළියේ ගලවලා තියනවා. අනික පිළිවෙලකට ගලවලා මුල්ලෙන් තියලා තිබුණා.

ඒ සපත්තු දෙක අපේ ගෙදර කාගේවත් නෙමෙයි. අනික් එක තමයි ඒ සපත්තු දෙක හොඳ වැදගත් පිරිමි කෙනෙක් දාන දෙකක් කියලා බැලූ බැල්මට ම පේනවා. අනික ඒ සපත්තු දෙකේ අඩියේ ගහලා තියෙනවා නවසීලන්තයේ නිෂ්පාදිත එකක් කියලා.ඒ වගේ ම එංගලන්තයට නවසීලංතයෙන් බඩු ගෙන්නන්නේ නෑ මොකද,නවසීලංතේ බඩු හොද ගුණාත්මක තත්ත්වයේ ඒවා නිසා ඒවා ගණන් වැඩියි.ඉතින් මේ අපි ජීවත් වන එංගලංතයේ ඉදලා නවසීලංතයට ගොඩක් දුරයි. එච්චර දුරක් ගිහින් මෙච්චර හොද සපත්තු ගේන්න තරම් අපේ පුතාට ඉන්න එක ම යාළුවා නොක්ස් විතරයි.''


"මේ ඇයි අම්මා ඔයා ෂර්ලොක් හෝම්ස් වුනේ නැත්තේ ?"ඩ්‍රැවෙනො සින වෙමින් ඇසුවේ ය.

"කතා කරලා වැඩක් නෑ.අපේ අම්මටවත් බෑ මං ගැන ඔච්චර කියන්න."

"හරි හරි මම යන්නම්.ඔයාලා කතා කර කර ඉන්න."කියමින් ආර්ඩෙලෙනා මහත්මිය කාමාරයෙන් පිටව ගියා ය.

ඉන් පසු නොක්ස් තම කතාව නැවතත් ආරම්භ කලේ ය.

"ඒත් ඔඩෙසා කැමති වුනේ නෑ මාව වැම්පයර් කෙනෙක් කරලා එයා නිදහස් වෙන්න.ඒත් එක දවසක් රෑ මමයි ඔඩෙසායි සාදයකට ගිහිල්ලා එද්දී එය කාරෙකේ පිටිපස්සේ නිදාගෙන ආවා.ගෙදරට ආවාට පස්සේ මම එයාව ඇහැරෙව්වාට එයා ඇහැරුනේ නෑ.ඉතින් එයා බාගෙට ඇහැරුනාට පස්සේ මම එයාව අල්ලගෙන ගියේ එයා වැටෙයි කියලා.අන්තිමට එයාගේ දතක් මගේ බෙල්ලේ වැදුනා.එදා ඉදලා මම වැම්පයර් කෙනෙක්."කියා නොක්ස් තම දුක්බර කතාව අවසන් කළේ ය.



ඉන්පසු නොක්ස් ඩ්‍රැවෙනොගේ නිවසෙන් පිටත් වුණේ ය.එවිටම ඔහුට තම මවගෙන් දුරකථන ඇමතුමක් ලැබුණි.නමුත් ඒ වන විට ඔහු සිටියේ තම නිවසට ළඟා වෙමින් ය.එනිසා ඔහු සිතුවේ තම මව ඔහු පරක්කු ඇයි දැයි විමසීමට කතා කරනවා කියා ය.එම නිසා ඔහු එම ඇමතුම විසන්ධි කළේය.ඔහු නිවසට ඇතුළුවූ පසු තම මව සොයා බැලුවේ ය.නමුත් ඔහුට තම මව සොයා ගැනීමට නොහැකි විය.එම නිසා ඔහු තම මවගේ සේවිකාවට කතා කළේය.


"මගේ අම්මා  කොහෙද?"නොක්ස් විමසුවේ ය.


"එතුමිය ඉස්පිරිතාලෙට ගියා."කියා සේවිකාව පිළිතුරු දුන්නා ය.

ඒ විගසම  නොක්ස් තම මවට දුරකථන දුරකථන ඇමතුමක් ගත්තේ ය.

නමුත් දැන් ඇය එම දුරකථන ඇමතුම විසන්ධි කළා ය.එම නිසා නොක්ස් වහාම යළිත් කාරයට නැඟ ඉස්පිරිතාලයට ගියේය. යන විට ඔහුගේ මව ඉස්පිරිතාලයට ගොස් තිබුණා ය.

ඔහු ගොස් බලන විට තම නංගී වන ඔඩෙසා රිය අනතුරකට පත් ව සිටියා ය.එනිසා ඔහු ඇය සිටි හතරවන වාට්ටුවට ගියේ ය.ඔහු යන විට ද  ඇයට සිහිය පැමිණ තිබුණේ නැත.පසුව ඇයට සිහිය එන විට ඇය අසළ සිටියේ නොක්ස් ය.එවිට ඇය  අතීතයට ගොස් සිටියා ය.එනිසා ඇය සියළු දේ දැන සිටියා ය. ඇය දැන් සියළු දේ දන්නා බව ඇය නොක්ස්ට ද පැවසුවා ය. ඇය සුව වී නැවත පාසල් යැම අ ැරඹූ පසු ඇය තමන් දැනගත් දේ පිළිබඳ ව තම අයියාගේ යහළුවන්ගේ නංගිලාට පැවසුවා ය.





ඉන් ටික දවසකට පසු නොක්ස්ට වැම්පයර් ලොවේ සිටින බලවතුන්ගෙන් ලිපියක් ලැබුණේ ය.එම ලිපිය කියවූ පසු නොක්ස්ට විශාල බියක් දැනුනේ ය.ඒ එම ලිපියේ සඳහන් වූ දෙයටයි.

එම අවස්ථාවේ ම නොක්ස් තීරණය කළේ එම ලිපිය රැගෙන තම මිතුරා වන  ඩ්‍රැවෙනොගේ නිවසට යැමට ය.පසුව ඔහු තම නංගී වන ඔඩෙසාව පාසලට ගොස් දමා තම  මිතුරාගේ නිවසට ගියේ ය.ඉන් පසු එම ලිපිය ඔහු අත තැබුවේ ය.ඉන් පසු ඔවුන් තීරණය කරේ මෙම ලිපිය පිළිබඳ ව තව දුරටත් සොයා බැලීමට ය.පසුව ඔවුන් සොයා ගත්තේ වැම්පයර් ලොවේ බලවතුන් කර තිබෙන ශාපය ඉවත් කිරීමට ක්‍රමයක් නොමැති බවයි .එනිසා ඔවුන් තමන්ට අත් වීමට තිබෙන ඉරණම පිළිබඳ ව සිත සාදා ගත්තෝ ය.

එම ඉරණම ඔවුන් අනෙක් මිතුරන්ට ද කීවෝ ය.ඉන් දවස් තුනකට පසු පුර පුන් පෝය දින විය. ඔවුන් එදින රාත්‍රියේ තම නැගනියන් ට සියළු ඇත්ත ලිපියකින් ලියා තබා නින්දට ගියේ ඉතා බියෙනි.ඉන් ටික වේලාවකට පසු එනම් මධ්‍යම රාත්‍රියේදී පමණ ඔවුන් ව කවුරුන් හෝ විසින් ඇහරවා ඔවුන්ගේ ඇගට ශුද්ධ වූ ජලය වත් කර මර දමා ඇත.ඊළඟ දිනයේ උදෑසන ඔවුන්ගේ දෙමාපියන් වැම්පයර් වරුන්ගේ කාමර වලට ගොස් බැලූ විට ඔවුන් සිට නැත.ඒ ඔවුන් ශුද්ධ වූ ජලයට දිය වී ගොස් තිබූ නිසා ය.පසුව ඔවුන්ගේ පවුලේ අය ඔවුන් ලියා තැබූ ලිපි දකින්නට ඇත.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියන රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් ''හ්මමාලා උපහාර'' ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවහ්‍යතාවක් වන කාන්තාව සවිලබ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්,විදුහල්පතිනිය,ගුරුභවතුන්,දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපාති නිර්මාතෘ)